*සැ. යු.* - 2018.11.02 දින පළ වූ අංක 2,096 දරන ගැසට් පත්‍රයේ III සහ IV(අ) කොටස් පළ නොවීය.
මෙම ගැසට් පත්‍රය ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින් වෙන වෙනම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,097 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1888 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1911 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1925 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 නොවැම්බර් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 නොවැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1887- B 81467— 5,403 (2018/11)

# තනතුරු - ඇබෑර්තු

## කළුතර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | වයස් සීමාව | බඳවා ගැනීම | පළපුරුද්ද | කායික සුදුසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු - III | 01 | PL3-2016 රු.25,790- 10x270- 10 x300 - 10 x330 - 12 x 350- රු. 38,990 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.) | 1. පෞද්ගලික/ කුලීරථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු සාටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ " සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. | වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟිනි. | බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.) | 1. අවම උස අඩි පහක් (5') විය යුතුය.<br><br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය. |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | වයස් සීමාව | බඳවා ගැනීම | පළපුරුද්ද | කායික සුදුසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 04 | PL1-2016 රු. 24,250 -10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330- රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය) | අදාළ නැත | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් දෙනු ලැබේ. | අදාළ නැත | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාව යෙන් යුක්ත විය යුතුය. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;

(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;

(iv) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ;

(v) දන්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබූවෙකු නොවිය යුතුය;

(vi) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතුය;

(vii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුරු ස්ථිරය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයන් අවුරුදු 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ;

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකග විය යුතුය.

මෙම බඳවා ගැනීම් කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලට ද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්කළ යුතු ආකාරය* :-

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2018.11.30 වැනි දිනට පෙර "ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව, ගාලු පාර, වස්කඩුව." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(i) අයදුම්පත බහාලන කවරයේ වම්පස දකුණු කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(ii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පාසැල් හැර යාමේ සහතිකය,
4. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
5. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික.

05. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවාගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. සී. පී. වීරසේකර,
ලේකම්,
කළුතර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*කළුතර ප්‍රාදේශීය සභාව*

**.................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :.........................................................................

1. මුලකුරු වලින් හැඳින්වෙන නම :.........................................................................

02. ස්ථිර ලිපිනය :.........................................................................

03. උපන් දිනය :.........................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :.........................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. දුරකථන අංකය :.........................................................................

07. විවාහක/අවිවාහක බව :.........................................................................

08. අධ්‍යාපන සුදුසුකම් :.........................................................................

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :.......................................

8.2 අ. පො. ස. (සා.පෙළ) විභාගය :

(i) වර්ෂය:.................. මාසය:..................

(ii) විභාග අංකය:..................

(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය

(i) වර්ෂය :………………… මාසය :…………………

(ii) විභාග අංකය :…………………

(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :……………………………………………………………

10. වෙනත් සුදුසුකම් :……………………………………………………………

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද/නැත් ද යන වග :………………

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව මම දනිමි.

...................................... ,

අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………

11 - 683

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දිනැතිව හා අර්ධ ශිල්පීය ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2009.05.12 දිනැතිව අනුමතකර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක් ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 02. වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 04 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 03. පුස්තකාල උපස්ථායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 04. නළ ළිං පොම්ප කාර්මික | ප්‍රාථමික (අර්ධ ශිල්පීය) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 2 2016) රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |

01. *කාර්යාල කර්ය සහායක, වැඩ/ක්ෂේත්‍ර කම්කරු(මාර්ග) හා පුස්තකාල උපස්ථායක තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :*

I. *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයය හැර)

II. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරා ඇති අය ව්‍යුහගත සම්මඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් ලත් අය බඳවා ගනු ලැබේ.

III. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව තෝරාගනු ලැබේ. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදයක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

02. නළ ළිං පොම්ප කාර්මික තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්:

I. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* බාහිර අයදුම්කරුවන් :

අ.පො. ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත් වී තිබිය යුතුය.(වෛකල්පිත විෂයය හැර)

*(ආ)* අභ්‍යන්තර අයදුම්කරුවන් :

පළාත් සහා රාජ්‍ය සේවයේ වාරියපොළ ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු (PL - 1 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජය විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

II. *ශිල්පීය නිපුණතා* :

රජය පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතිය ආයතනය විසින් පිළිගත් ආයතනයක නළ ළිං පොම්ප කාර්මික/නළ ළිං කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම)

III. *පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 2කට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

IV. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවය කරන අනියම්/ආදේශක/තාවකාලික සේවකයින් සඳහා ද, ස්ථිර සේවයේ නියුතු PL 1 වැටුප් ක්‍රමයට අදළ තනතුරු දරන අය සඳහා ද වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

V. *පොදු කොන්දේසි (සියලුම තනතුරු සඳහා)*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
5. වාරියපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරිගෙන් ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකය අදළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වාරියපොළ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

VI. ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අයෙක් හෝ අනියම්/ආදේශක/තාවකාලික සේවයේ යෙදී සිටින අයෙකුට නම් වයස් සීමාව බලනොපාන අතර, ඔහු/ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලැබීමක් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

VII. *අයදුම්පත් එවිය යුතු පිළිවෙළ* :

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2018.11.30 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, වාරියපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතිකය ;
3. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය (අර්ධ ශිල්පීය තනතුරු සඳහා);
4. ජාතික හැඳුනුම්පතෙහි පිටපත;
5. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;
6. නළ ළිං පොම්ප කාර්මිකවරයෙකු ලෙස සේවය කිරීමට අදාළව වසර 02කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**වාරියපොල ප්‍රාදේශීය සභාවේ ............................................................ තනතුර සඳහා වූ අයදුම්පත්‍රය**

01. මුලකුර සමග නම :....................................................................
මුලකුරුවලින් හැඳින්වෙන නම් :..................................................................
02. පෞද්ගලික ලිපිනය:..................................................................
03. උපන් දිනය : අවුරුද්ද:.................. මාසය:.................. දිනය:..................
(අ) 2018.11.30 දිනට වයස අවු. :.................. මාස:.................. දින :..................
04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:..................................................................
05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචියෙන්ද ?:................................................
06. ස්ත්‍රී/පුරුෂභාවය :..................................................................
07. විවාහක/අවිවාහක බව :..................................................................
08. සමත් ව ඇති ඉහළම විභාගය :..................................................................
09. ශිල්පීය නිපුණතා :..................................................................
10. වෘත්තීය සුදුසුකම් :..................................................................
11. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේද? :..................................................................
12. එසේ නම් දඬුවමේ ස්වභාවය :..................................................................
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :............................................

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් , නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

..................
අයදුම්කරුගේ අත්සන.

දිනය:..................

11-753

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කටාන ප්‍රාදේශීය සභාව - 2018 වර්ෂය

කටාන ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ සථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01. | පෙර පාසල් පාලිකා | 01 | III | MN-1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු.27,140-10x300-11x350-10x495-10x660- රු.45,540/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 27,140 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 02. | රියදුරු | 04 | III | PL-3-2016 - (රා.ප.ච. 3/2016 අනුව) රු. 25,790-10x270-10x300-10x330-12x350- රු.38,990/- හතරවන වැටුප් පියවරට එළැඹීමට වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 25,790, 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 03. | පුස්තකාල සහායක | 01 | III | PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36,410/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250, 4 වන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) |
| 04 | කාර්යාල කාර්ය සහායක | 01 | III | |
| 05. | මුරකරු | 01 | III | |
| 06. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 08 | III | |

01. **පෙර පාසල් පාලිකා III ශ්‍රේණිය**

සීමිත බඳවා ගැනීම :

*අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුය.

*වෘත්තීය සුදුසුකම් :*

පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපනය හා ළමා සංවර්ධනය පිළිබඳව මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

*පළපුරුද්ද :*

අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවයේ ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයන් විය යුතු අතර මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

*බඳවා ගන්නා ක්‍රමය :*

ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

*ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය -*

(පහත දක්වා ඇත.)

*විවෘත බඳවා ගැනීම :*

සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවල දී පමණක් විවෘත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය.

සහ

අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම් :*

පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපනය හා ළමා සංවර්ධනය පිළිබඳව මාස 06 කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

*පළපුරුද්ද* :- අදාළ නැත.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-30 අතර විය යුතුය.

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

සීමිත හා විවෘත බඳවා ගැනීමේ ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගීතාව හා බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම | 40% |
| සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජීය, අධ්‍යාපන විද්‍යාත්මක, සංස්කෘතික දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වේ. | 40% |

**02. රියදුරු III ශ්‍රේණිය**

1. විවෘත බඳවා ගැනීම්

අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනණක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් (6) ක් සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)

වෘත්තීය සුදුසුකම් :

1. පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන්රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ බල පත්‍රයක් ලබාතිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

පළපුරුද්ද :

බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු වශයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.
පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.

කායික සුදුසුකම්.- අවම උස අඩි 05 ක් විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදවීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

වයස :- වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

බර වාහන සඳහා :

බර වාහන රියදුරු බලපත්‍රය (තාරබර හොන්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් A1 සහ C1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "B" සහ "D1" පන්තියේ බලපත්‍රයක් *නැතහොත්* තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.

බඳවා ගන්නා ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

වෘත්තීය පරීක්ෂණය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

**03. පුස්තකාල සහායක, කාර්යාල කාර්ය සහායක, මුරකරු**

සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් හයක් (6) ක් සමත් වී තිබීම. (මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :-

* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා.පෙළ) විභාග යේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>• සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>• සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>• අධිසම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>• විශිෂ්ට සම්මානයට - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය - සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම. | 05 | |

**සටහන .-** පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බලනු ලැබේ.

වයස :

අවම සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරු 18ට නොඅඩු විය යුතුය.

උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**04. වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය**

සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම් :- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය - (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

සටහන : පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බලනු ලැබේ.

වයස :

අවම සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :

වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම
II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.
III. යහපත් චරිතයකින් යුක්ත වීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.
V. අදල බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව විධිමත් ලිඛිත පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණවලට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.
VI. කිසියම් අයදුම්කරුවෙකු සමමුඛ පරීක්ෂණයට කැඳ වූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.
VII. පෙර අනුමත බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් ඇතැම් කරුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු විසින් අනුමත කරන ලද 2012.07.25 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් තොරතුරු හා අංක 1950/47 දරන 2016.01.21 දිනැති සහ අංක 1986/27 දරන 2016.09.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීම උපලේඛනයේ සඳහන් තොරතුරු සමග නොගැළපෙන අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පරිපාටිවල සඳහ් අදළ කොන්දේසි අදළ පරිදි ආදේශ කරනු ලැබේ.

*සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

ii. අදාළ පරිදි වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

iv. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන සේවකයින් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.

v. මෙයට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කර්ය පරිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති. බස්නාහිර පළාත් සභා රාජ්‍ය කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත්විය යුතුය.

vi. මෙයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද. බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාර තුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියෝග වලටද අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන නියෝග වලටද අනුව කටයුතුකළ යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

i. මේ නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදසියක (අංක 01 සිට 2.2 දක්වා පළමු පිටුවේ ද, අංක 2.3 සිට 7 දක්වා දෙවන පිටුවේද, අංක 8 සිට ඉදිරියට තුන්වන පිටුවේ ද වන සේ) අයදුම්පතක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්පත් බහාලන කවරයේ "වම්පස ඉදිරි කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.12.07 වන දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

iii. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

iv. තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වැඩි ගණනක් සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.

vi. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සහතික හෝ ලබා ගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික,
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,
(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික,
(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
(ඊ) ජාතික හැඳුනුම්පත්‍රයේ හෝ වලංගු රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායා පිටපත
(උ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 06 කට නොඅඩු කාලයක් තුළ ලබා ගත් එකක් විය යුතුය.)

*පුරප්පාඩු තෝරා ගන්නා ක්‍රමය* :

i. අයදුම්පත් කැඳවන අවසාන දිනට ඉල්ලුම් කරනු ලබන සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

ii. ඉහත තනතුරු අතරත් ලිඛිත පරීක්ෂණයක් හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් ඉහළ පැවත්වීම අවශ්‍ය වන තනතුරු සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතික අනුව අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කළ බවට තහවුරු කරගත් අපේක්ෂකයන් අතරින් පුරප්පාඩු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

iii. ලිඛිත පරීක්ෂණයෙන් හෝ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගෙන ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතික වල මුල් පිටපත් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ අය අතරින් පුරප්පාඩු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

iv. සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්පත් පිළිබඳව සලකා බලනු ලැබේ.

v. කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න කටාන ප්‍රාදේශීය සභා ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

vi. මේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් හෝ වෙනත් කවර හෝ තැනැත්තෙකුට විශේෂයෙන් කිසියම් බලපෑමක් කිරීම අපේක්ෂත්වය අවලංගුවීමක් සේ සලකනු ඇත.

vii. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ වෙනස් කිරීමට හෝ නිවේදනය සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ කටාන ප්‍රාදේශීය සභා ලේකම් විසින් කරනු ලැබිය හැකිය.

viii. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළු කාරණා පිළිබඳ අවසාන තීරණය කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය

ආර්. එම්. එම්. ඩී. රත්නායක.
ලේකම්,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ කටාන ප්‍රාදේශීය සභාවේ

**........................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය**

[ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ජීව දත්ත තොරතුරු :

1.1 මුලකුරු සමග නම :..........................................................................

සම්පූර්ණ නම :..............................................................

..............................................................

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:.............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:..............................

ග්‍රාම නිලධාරී කොට්ඨාස: අංකය:........................... නම:..............................

1.2 ස්ථිර පදිංචි ලිපිනය :...........................................................................

1.4 දුරකථන අංකය :.......................................
1.5 ජාතික හැඳුනුම්පත් අංකය :.....................................නිකුත් කළ දිනය :.............................

1.6 උපන් දිනය : අවුරුද්ද :............... මාසය :............... දිනය:...............

2018.12.07 දිනට වයස ඃ
අවුරුදු :............... මාස :............... දින:...............

1.7. ස්ත්‍රී/පුරුෂ භාවය :.............................විවාහක/අවිවාහක තත්වය :........................
1.8. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය අවුරුදු :............... මාස :...............දින:...............
1.9. ශ්‍රී ලංකා පුරවැසියෙකු ද නැත්ද යන වග ඃ

2. අධ්‍යාපන සුදුසුකම් ඃ
2.1 අයදුම්කරු අවසාන වරට සමත් වූ පන්තිය :........................
පාසල :........................

2.2 අ. පො.ස. (සා. පෙළ) විභාගය ඃ

පළමුවර - විභාග අංකය :........................
වර්ෂය හා මාසය:........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9 | |
| 10. | |

දෙවන වර විභාග අංකය:........................
වර්ෂය හා මාසය:........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9 | |
| 10. | |

2.3 අ.පො.ස.(උ.පෙළ) විභාගය ඃ
විභාග අංකය :........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

3. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :……………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

4. සේවා පළපුරුද්ද:………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

5. වෙනත් සුදුසුකම් :………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

6. ඉහත තොරතුරු සනාථ කිරීමට පහත ලිපි ලේඛනවල ඉදිරිපත් කර ඇති බව සනාථ කිරීම.

6.1 උප්පැන්න සහතිකය;
6.2 අධ්‍යාපන සහතික හෝ ලබා ගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දක්වෙන වෙනත් සහතිකවල සහතික ;
6.3 වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික;
6.4 පළපුරුද්ද පිළිබඳ සහතික;
6.5 මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්;
6.6 ජාතික හැඳුනුම්පත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත;
6.7 ප්‍රාදේශීය ලේකම විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
6.8 ඔබගේ නම ලිපිනය ලියන ලද 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක්

7. ඔබ උසාවියකින් වරදකට වරදකරු කරනු ලැබ තිබේද?

8. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් මෙහි සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් වීම ලැබීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

…………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ*
*අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත ඉල්ලුම්පත්‍රයේ ඉල්ලුම්කරු වන ............................................ මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..... .................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට(අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

…………………………,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :…………………
තනතුර :…………………
දිනය :…………………

11-731

## මහරගම නගර සභාව

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2018.11.30 වන දින දක්වා භාර ගනු ලැබේ.

අයදුම්පත් ලේකම්, මහරගම නගර සභාව, මහරගම'' යන ලිපිනයට 2018.11.30 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. තනතුරු හා වැටුප් පරිමාණය:

| | |
|---|---|
| රියදුරු | රු. 25,790- 10x270-10x300-10x330-12x350-රු. 38,990/- |
| පැස්සුම්කරු | රු. 25,250- 10x270-10x300-10x330-12x350-රු. 38,450/- |
| ජල පොම්පක්‍රියාකරු | රු. 25,250- 10x270-10x300-10x330-12x350-රු. 38,450/- |
| ආදාහනාගාර ක්‍රියාකරු | රු. 24,250- 10x250-10x270-10x300-12x330-රු. 36,410/- |
| මුරකරු | රු. 24,250- 10x250-10x270-10x300-12x330-රු. 36,410/- |
| කාර්යාල කාර්ය සහයක | රු. 24,250- 10x250-10x270-10x300-12x330-රු. 36,410/- |
| සෞඛ්‍ය කම්කරු<br>වැඩ ක්ෂේත්‍ර කම්කරු | රු. 24,250- 10x250-10x270-10x300-12x330-රු. 36,410/-<br>රා.ප.ච 3/2016 (උප ලේඛන II අනුව) |

02. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

03. අධ්‍යාපන සුදුසුකම්:

| | |
|---|---|
| රියදුරු | අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 02 සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.) |
| ජල පොම්ප ක්‍රියාකරු | අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 සමත් වීම (මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතුය.) |
| පැස්සුම්කරු | - එම - |
| මුරකරු | - එම - |
| කාර්යාල කාර්යසහයක | - එම - |
| ආදාහනාගාර ක්‍රියාකරු<br>සෞඛ්‍ය කම්කරු/වැඩ ක්ෂේත්‍ර කම්කරු | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය. |

04. වෘත්තීය සුදුසුකම්:

| | |
|---|---|
| ආදාහනාගාර ක්‍රියාකරු<br>පැස්සුම්කරු<br>ජල පොම්පක්‍රියාකරු | අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම. |
| රියදුරු | 1. භාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ පැදවීමේ රියදුරු බලපත්‍ර ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් A 1 සහ C 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රය ලබා තිබීම.<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම |

| | |
|---|---|
| කාර්යාල කාර්ය සහයක | අදාල නැත |
| මුරකරු | අදාල නැත |
| සෞඛ්‍ය කම්කරු | අදාල නැත |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | අදාල නැත |

(05) *පළපුරුද්ද :*

රියදුරු — බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කලයුතුය)

ආදාහනාගාර ක්‍රියාකරු, ජල පොම්පක්‍රියාකරු, පැස්සුම්කරු — අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස 06ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(06) *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.
(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතු වේ).
(iii) මෙම තනතුර වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

(07) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.
(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකුවීම.
(iv) යහපත් චරිතයකින් යුක්ත වීම.
(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම.
(vi) රියදුර තනතුර සඳහා -
අවම උස අඩි 5 විය යුතුය. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කල යුතුය.

(08) *වයස් සීමාව* අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

(09) *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) **රියදුරු :**

වෘත්තීය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින්,
වෘත්තීය පරීක්ෂණයඃ

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| (i) රියපැදවීමේ නිපුණතාව | 40 | 20 |
| (ii) මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| (iii) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |
| මුළු ලකුණු | 100 | |

(ii) **මුරකරු, කාර්යාලකාර්ය සහයක** :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය,

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(iii) **ආදාහනාගාර ක්‍රියාකරු, ජල පොම්ප ක්‍රියාකරු, පැස්සුම්කරු** :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| සාමාන්‍ය දැනුම | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(iv) **සෞඛ්‍ය කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු** :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(10). ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද/මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනත්වල විධිවිධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

(11). මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

වී.ජී. විනීතා ඇපා,
ලේකම් *(වැ.බ.)*

2018 නොවැම්බර් මස 02 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේදී.

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජන සඳහා

ආදර්ශ අයදුම් පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ..............................................................................................**
**තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්)
..............................................................................................................................................................................
..............................................................................................................................................................................

03. මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
..............................................................................................................................................................................
. ..............................................................................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) තාවකාලික ලිපිනය (සිංහලෙන්)
..............................................................................................................................................................................
..............................................................................................................................................................................

05. උපන් දිනය:- අවුරුද්ද: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස:- අවුරුදු: [ | ] මාස: [ | ] දින: [ | ]

07. ජාතික හැඳුනුම්පත් අංකය:- [ | | | | | | | | | | | ]

(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය)

08. විවාහක/අවිවාහක බව:-..........................................................................

09. දුරකථන අංකः- පෞද්ගලිකः- ..........................................................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාවः-...........................................................................
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය)

11. අධ්‍යාපන සුදුසුකම්ः-
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය).

12. පළපුරුද්දः
.............................................................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්)ः-
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය).

14. (i) ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේ ද (ඔව්/නැත)
(ii) ඔබගේ පිළිතුරු ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද? ...................................................................................................
.............................................................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල .......................................................... III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ......................................................... III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සකු වන බවත්, පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහකළ හැකි බවත් මා දනිමි.

..............................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය ः-................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................ මයා/මිය/මෙනවිය දැනට .......................................................... කාර්යාලයේ/ ආයතනයේ ....................................................... දින සිට මේ දක්වා .........................................................(තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම්/(අනවශ්‍ය වචන කපා හරින්න.) තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

.........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව

දිනයः..........................................................
සහතික කරන නිලධාරියාගේ නමः..........................................................
තනතුරः ..........................................................
ලිපිනයः..........................................................

11-751

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක III | 01 | PL1-2016<br>රු. 24,250-10x250-10x270<br>10x300-12x330-<br>රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත්විය යුතුය.) |
| 02 | ඖෂධ සංයෝජක III | 01 | PL2-2016<br>රු. 25,250-10 x270-10 x 300<br>10 x 330-12 x350-<br>රු. 38,450 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය)<br><br>පළපුරුද්ද ៖<br><br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.) |
| 03 | පෙර පාසල් ගුරු III | 01 | MN 1-2016<br>රු. 27,140-10 x 300-11 x 350<br>10 x 495-10 x660-<br>රු. 45,540 | *(අ)* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව/ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් 06කින් අ. පො. ස. සා.පෙළ විභාගය සමත්ව තිබීම.<br>(ආ) අ.පො.ස. උසස් පෙළ විභාගයේදී අවම වශයෙන් එක් විෂයක්වත් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)<br><br>වෘත්තීය සුදුසුකම් ៖<br><br>පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදරා සහතිකයක් ලබා තිබිය යුතුය. |
| 04 | සෞඛ්‍ය කම්කරු III | 04 | PL1-2016<br>රු. 24,250-10x250-10x270<br>10x300-12x330-<br>රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

02. *කායික සුදුසුකම් .-* තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් ៖*

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඩුවම් ලැබුවෙකු නොවිය යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(I) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2018.11.28 වැනි දින හෝ එදිනට පෙර ''ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(II) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළයුතුය.

(III) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය
*(ආ)* අධ්‍යාපන සහතික
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය)
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්ලිව්. පාලිත සිසිර කුමාර,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

2018 නොවැම්බර් මස 05 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

***වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ. . . . . . . . . තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :.........................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :.................................................................
3. ස්ථිර ලිපිනය :.........................................................................
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.........................................................................
5. දිස්ත්‍රික්කය :.........................................................................
6. උපන් දිනය : අවුරුද්ද:.......................; මාසය:.......................; දිනය:.......................;
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.11.28) වයස : අවු.:..................මාස:.................. දින :..................
8. ස්ත්‍රී පුරුෂ භාවය :........................................
9. විවාහක/අවිවාහක යන වග :........................................
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන් ද යන වග :........................................
11. ජාතික හැඳුනුම්පත් අංකය :........................................
12. දුරකථන අංකය :........................................
13. අධ්‍යාපන සුදුසුකම් :........................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

...................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය:..............................

11-922

# පළාත් පාලන නිවේදන

## වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2018.09.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05.4 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 26 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ 2011.01.18 දින වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 වන දින අංක 1703 /18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳම් කටයුතු, ප්‍රාදේශීය සභා සීමාව තුළ සංචාරක වෙළෙඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් හා මංමාවත් සැරසිලි කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවන් මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළි ගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (3) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11-306

---

## මාවතගම ප්‍රාදේශීය සභාව

### මංමාවතක් පිළිබඳ දැන්වීමයි

අංක 2,075 හා 2018.06.08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටා ඇති පරගහදෙනිය කොට්ඨාසයට අයත් වැලිගොඩේ හේන නැමැති මංමාවත සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තියට අනුව කිසිම විරෝධතාවයක් ලැබී නොමැති බැවින් එම මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස ක්‍රියා කරන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

2018 සැප්තැම්බර් මස 10 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

11-307

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ කැගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළකර සිටින්නේ නම් මෙම නිවේදනයේ සිට මසක් ඇතුළත විරෝධතා ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

චන්දන කුමාර ජයවන්දල,<br>සභාපති,<br>ප්‍රාදේශීය සභාව - මාවනැල්ල.

2018 ඔක්තෝබර් මස 23 වැනි දින,<br>මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය් දී ය.

**උපලේඛනය 01**

පාරේ නම - දාස්වත්ත මාර්ගයේ සිට පාට්ටගම දක්වා ඇති මාර්ගයේ අතුරු මාර්ගය<br>
පාරේ දිග - අඩි 850<br>
පළල - අඩි 08<br>
පාරේ ආරම්භය සිට අවසානය දක්වා - ගොඩ පාරේ සිට දාස්වත්ත ලෙව්කේ මාර්ගය දක්වා ග්‍රාම නිලධාරි කොට්ඨාසය - 18 බී දාස්වත්ත

| *වම්පස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ජී. ජී. පොඩිනෝරිස් | දස් වත්ත බොරලුව |
| ජී. ජී. කුලතුංග | වේපතකොටුවේ කුඹුර |
| ජී. ජී. ආර්. එස්. වීරරත්න | වේපතකොටුවේ කුඹුර |
| ජී. ජී. සිරිසේන | වේපතකොටුවේ කුඹුර |
| ජී. සිරිසේන | මීගොන් කොටුව |
| ජී. ජී. පියසේන | මුතුකෙලියාතැන්න |
| ජී. ආර්. රූපසිංහ | මුතුකෙලියාතැන්නේ හේන |
| ජී. ජී. ඉන්ද්‍රානි මල්ලිකා | මුතුකෙලියාතැන්නේ හේන |

| *දකුණු පස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ජී. ජී. අජිත් කුමාර සිංහ | දස්වත්ත බොරලුව<br>පුරාණෙ පැල පහළ කොටස |
| ජී.ජී. සිරිසේන | වේපතකොටුවේ කුඹුර |
| ජී. සිරිසේන | මීගොස්කොටුව |

**උපලේඛනය 02**

පාරේ නම - නිකතැන්න වත්ත පාර<br>
පාරේ දිග - මීටර් 120<br>
පළල - මීටර් 2.74<br>
පාරේ ආරම්භය සිට අවසානය දක්වා - හිගුල රජමහා විහාර පාරේ සිට නිකතැන්න වත්ත දක්වා<br>
ග්‍රාම නිලධාරි කොට්ඨාසය - හිගුල

| | |
|---|---|
| *වම්පස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
| ජී. එම්. එම්. එච්. මැණිකේ | ගමේවිදානෙලාගේ වත්ත |
| *දකුණුපස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
| පූජ්‍ය මාවතගම සුමංගල හිමි | පහළ අගුලැව |
| ඩබ්ලිව්. පී. නවරත්න | ඉහළ අගුලැව |

11-507

---

**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව**

වර්ෂ 2019 වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරියේ) 212 ඡේදය ප්‍රකාර, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාවේ 2019 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2018 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින සිට නොවැම්බර් මස 30 වැනි දින දක්වා කාර්යාලයීය වේලාව තුළදී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

11-374

---

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර

ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
වරකපොල ප්‍රාදේශීය සභාව,
වරකාපොල.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට පැවල 2018 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් පහත 01 වැනි උපලේඛනයේ පරිදි 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් වරකාපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

***වරිපනම් බදු - 2019 වර්ෂය සඳහා***

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2019 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2019 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2019 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා | 2019 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2019 ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2019 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2019 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2019 ඔක්තෝබර් 31 |

01 වන උපලේඛනය

| | |
|---|---|
| අගුරුවැල්ල පාර වම/දකුණ | 9% |
| කොළඹ පාර වම/දකුණ | 9% |
| නුවර පාර වම/දකුණ | 9% |
| මීරිගම පාර වම/දකුණ | 9% |
| ඇත්නාවල පාර වම/දකුණ | 7% |
| මාදෙනිය පාර වම/දකුණ | 7% |
| පිළාඩුව පාර වම/දකුණ | 7% |
| පන්සල පාර වම/දකුණ | 7% |
| රෝහල් පටුමග පාර වම/දකුණ | 7% |
| මෙනේරිපිටිය පාර වම/දකුණ | 7% |
| නැව්ගල පාර වම/දකුණ | 7% |
| පළමු පටුමග පාර වම/දකුණ | 7% |
| අලව්ව පාර වම/දකුණ | 7% |
| අඹේපුස්ස පාර වම/දකුණ | 7% |
| දේවාල පාර වම/දකුණ | 7% |
| අලව්ව පාර තුල්හිරිය පාර වම/දකුණ | 6% |

**දියුණු ගම් ප්‍රදේශ**

දූදිගම

- ජයලත් කන්ද පාර වම/දකුණ 6%
- ගලපිටමඩ පාර වම/දකුණ 6%
- නෙළුන්දෙනිය පාර වම/දකුණ 6%

නෙලුන්දෙනිය

- අලව්ව පාර වම/දකුණ 6%
- කොළඹ පාර වම/දකුණ 6%
- දූදිගම පාර වම/දකුණ 6%
- නුවර පාර වම/දකුණ 6%

වාරියගොඩ

- නෙළුන්දෙනිය පාර වම/දකුණ 6%
- කොළඹ පාර වම/දකුණ 6%

තල්ලියැද්ද

- තල්ලියැද්ද පාර වම/දකුණ 6%

ඩඩ්ලි සේනානායක මාවත

- දේවාල පටුමග වම/දකුණ (අඹේපුස්ස) 6%
- ඩඩ්ලි සේනානායක මාවත වම/දකුණ 6%

අඹගල පාර

- මස්ජිඩ් මාවත වම/දකුණ 6%
- අඹගල පාර වම/දකුණ 6%

තුංතොට

- අරන්දර පාර වම/දකුණ 6%
- ගලපිටමඩ පාර වම/දකුණ 6%
- නෙළුන්දෙනිය පාර වම/දකුණ 6%

11-489/1

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ - 05 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 5 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

*(අ)* හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2019 වර්ෂය සඳහා රුපියල් දහය (රු. 10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) වැනි කොටසේ 1989 පෙබරවාරි 03 (අ) දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත ම 2019 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට , සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද වරකාපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2019.01.01 සිට 2019.03.31 | 2019.01.31 |
| දෙවන කාර්තුව | 2019.04.01 සිට 2019.06.30 | 2019.04.30 |
| තුන්වන කාර්තුව | 2019.07.01 සිට 2019.09.30 | 2019.07.31 |
| හතරවන කාර්තුව | 2019.10.01 සිට 2019.12.31 | 2019.10.31 |

11-489/2

## තංගල්ල නගර සභාව

### නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරිය) 55 "අ" වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරියේ) 55 අ වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තංගල්ල නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාර "එස් එච් සවෝරිස් සිල්වා මාවත" නමින් නම් කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රවිඳු වෙදආරච්චි,<br>
සභාපති,<br>
තංගල්ල නගර සභාව.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,<br>
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | තංගල්ල නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | හම්බන්තොට |
| 03. | මාර්ගයේ භාවිතයේ පැවති නම | : | එස්. එච්. සවෝරිස් සිල්වා මාවත |
| 04. | අලුතින් යොදා ඇති නම | : | එස්. එච්. සවෝරිස් සිල්වා මාවත |
| 05. | මාර්ග විස්තරය | : | හම්බන්තොට පාර සිට මැදකැටිය දක්වා මාර්ගය |

11-311

---

## මහනුවර මහනගර සභාව

### 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවක්, එහි සඳහන් ස්ථානයන් හි පැවත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම පිණිස මා වෙත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවක් අසල හෝ එකී සමාජ ශාලාවන් සඳහා අපේක්ෂිත ස්ථානයක් අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දී සිට සති 4 ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජ ශලාවේ සභාපතිද ලේකම් ද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| ලේකම් | ලේකම් | කැන්ඩි ලේක් ක්ලබ් | අංක 07, සංඝමිත්තා මාවත, මහනුවර. |

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,<br>
නගරාධිපති,<br>
මහා නගර සභාව, මහනුවර.

11-416

F 3 - B 81466 (S)

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන ) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2018.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | : | හිරිවඩුන්න දියගම ප්‍රධාන මාර්ගයේ පන්සල හන්දියේ සිට ආරම්භ වන කලුගල්ල මාර්ගය දක්වා දිවෙන විහාර මාවත |
| | වසම | : | දියගම |
| | දිග | : | මීටර් 870 |
| | පළල | : | අඩි 10 |

| *පාරේ වම්පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| 01. රංජිත් ආනන්ද විජේවර්ධන | 1. සරත් විජේසිංහ |
| 02. පී. පී. දයානන්ද | 2. එස්. ජී. කේ. වික්‍රමසිංහ |
| 03. ඩබ්. සිරිලාල් ජිනදාස | |
| 04. අසිත තරංග ප්‍රේමසිංහ | |
| 05. බන්ධුල මහානාම ප්‍රතිරාජ | |



එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයවීම මාවත
දළුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
සී.ප. අංක 19831492
පිඹුරු අංකය. 4428/02
සැබෑ පිටපතයි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව
09 NOV 2018
2012.10.07
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
දුර : 035-2266422/077 4973610
සී.ප. අංකය: 19831492
පරිමාණය 1 - 1000
විස්තර සඳහා පසුපිට බලන්න

"02. පාරේ නම : නිල්මල්ගොඩ නන්දන උයන මාර්ගය
වසම : නිල්මල්ගොඩ වසම
දිග : මීටර් 110.30
පළල : අඩි 10

*පාරේ වම්පස*

01. ආර්. ඒ. බී. ධම්මික නවරත්න - නන්දන උයන වත්ත
02. එස්. ඒ. සී. එස්. සමරතුංග - නන්දන උයන වත්ත
03. ඩබ්. සෝමවතී - නන්දන උයන වත්ත
04. එච්. පී. ආර්. කේ. රූපසිංහ පෙරේරා - නන්දන උයන වත්ත
05. ඩී. පී. පී. ධම්මික - නන්දන උයන වත්ත

*පාරේ දකුණු පස*

01. ඒ. ආර්. සී. පී. කුමාර - නන්දන උයන වත්ත
02. ඒ. ආර්. එන්. පී. කුමාර - නන්දන උයන වත්ත
03. ඩබ්. ඒ. ජී. ජී. වනිගතුංග - නන්දන උයන වත්ත
04. එස්. ඒ. ජේ. ජේ. සමරතුංග - නන්දන උයන වත්ත
05. ඩබ්. ඒ. එස්. ජයසිංහ - නන්දන උයන වත්ත
06. එස්. ඒ. ඩී. සමරසිංහ - නන්දන උයන වත්ත

**Plan No. 16/829**

J.R.M.Bandara Jayakody
Licensed Surveyor, Leveller,
Court Commissioner,
"Mahinda", Molagoda,
Kegalle.




Reference

| | |
|---|---|
| ST | Stake |
| CP | Cement Post |
| LF | Live Fence |
| OL | Old Land mark |
| B | Bank |
| EP | Electric Pole |
| TP | Telegraph Pole |
| IR | Ion Rod |
| EDn | Earth Drain |
| RW | Retaining Wall |
| Road(RDA) | Road(Road Development Authority) |

සත්‍ය පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

Scale 1:1000

PLAN

An allotment of Land marked Lot 1 being resurvey of the existing boundaries of road (From Edvin Wijeratne Mawatha To Nandana Uyana Road), land called RADDALA ESTATE alias NANDANA ESTATE, situated at Bohara village,No.51A Nilmalgoda G.N.Division within Kegalle Pradeshiya Saba limit in Mawatha Pattu of Paranakuru Korale within

# KEGALLE DISTRICT
# SABARAGAMUWA PROVINCE

Bounded as described on Plan

| Length(m) | Width |
|---|---|
| 110.30 | More than 10Ft |

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.0373 | 0 | 0 | 14.74 |
| Total | 0.0373 | 0 | 0 | 14.74 |

Containing Extent (0.0373Hec. – 0A. 0R. 14.74P)

Gazette 09 NOV 2018

Note :– 1. Boundaries surveyed as pointed out by the owners

2016/7/25

J.R.M. BANDARA JAYAKODY
Licensed Surveyor & Leveller
Court Commissioner & Valuer
"Mahinda" Molagoda - Kegalle.
Tel: 035-2228773
Reg. No: 1991 12 31

Surveyed on : 2016/03/22

03. පාරේ නම : මාබෝපිටිය දේවාල හන්දියේ සිට ඉසෝදනවලහේන මාර්ගය

වසම : මාබෝපිටිය

දිග : මීටර් 370

පළල : අඩි 08

| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 01. එල්. චන්ද්‍රවතී | - ඉසෝදනවලහේන | 01. උපාලි | - ඉසෝදනවලහේන |
| 02. එල්. ජනක චන්දන ලේකම් | - ඉසෝදනවලහේන | 02. හර්ෂක නලීන් | - ඉසෝදනවලහේන |

එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයවීම මාවත
දළුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
ලි.ප. අංක 19831492

පිඹුරු අංකය. 281/2016



සත්‍ය පිටපතකි.

.........................................

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

පරිමාණය 1 -500

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ කදුඅඟ පත්තුවේ කෑගල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයේ කෑගල්ල ප්‍රා.සභා සීමාව තුළ මාබෝපිටිය ග්‍රා.නි වසමේ මාබෝපිටිය (වඩා නිවැරදිව ලෙස කම්මලුවත්ත) ගමේ පිහිටි ඉස්සෝදනවලේ හේන නැමති ඉඩම (දැනට පවතින ප්‍රවේශ මාර්ගය) දැනට භූමියේ දැක්වෙන මායිම් අනුව මැන සාදන ලද.

පිඹුර

මායිම් - ඉහත පිඹුරේ දැක්වෙන පරිදි වේ.

සම්පූර්ණ බිම්ප්‍රමාණය

| කැබලි අංක | හෙක්ටයාර් | අ | රූ | පර්චස් | |
|---|---|---|---|---|---|
| 01 | 0.033640 | 0 | 0 | 13.30 | අවම පළල අඩි - 08 |

මැනීම: 2016-10-10

එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
දුර - 035-2266422/077 4973610
ලි.ප. අංකය 19831492

09 NOV 2018

එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තළමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයබිම මාවත
දුලුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
ලි.ප. අංක 19831492

පිඹුරු අංකය. 4428/02

පිඹුර සඳහා පෙර පිට බලන්න

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කිණිගොඩ කෝරළයේ දෙයාලදහමුණ පත්තුවේ කෑගල්ල ප්‍රා.ලේ කොට්ඨාශයේ කෑගල්ල ප්‍රා.සභා සීමාව තුළ දියගම ගමේ පිහිටි කරාගේ වත්ත කොටසක්, පහළ ගෙදර වත්ත කොටසක් හා කාරාගේ කනටි කොටසක් මැන කැබලි අංක 01 ලෙසද, රිටිකුඹුර කොටසක් හා අංක 929 දරණ පිඹුරේ කබැලි අංක 01-10 කොටස් (උග්ගලේ පල්ලෙහ හෙවත් පොළඹුගහමුල කුඹුර) හා අංක 2961 දරණ පිඹුරේ කැබලි අංක 01හි කොටසක් (උග්ගලේ ගලගාව පරගහමුල කුඹුර) මැන කැබලි අංක 02 ලෙසද, ගොඩ පල්ලෙහ කුඹුර (අංක 4428/01 දරණ පිඹුරේ කැබලි අංක 04) මැන කැබලි අංක 03 ලෙසද, මහඅරඹ කොටසක් හා වෙලිගහමුල වත්ත කොටසක් මැන කැබලි අංක 04 ලෙසද ලකුණු කර සාදන ලද.

පිඹුර

මායිම් - ඉහත පිඹුරේ දැක්වෙන පරිදි වේ.

සම්පූර්ණ විම්ප්‍රමාණය

| කැබලි අංක | හෙක්ටයාර් | අ | රූ | පර්චස් |
|---|---|---|---|---|
| 01 | 0.012925 | 0 | 0 | 05.110 |
| 02 | 0.040469 | 0 | 0 | 16.000 |
| 03 | 0.013689 | 0 | 0 | 05.412 |
| 04 | 0.017301 | 0 | 0 | 06.840 |
| එකතුව | 0.084384 | 0 | 0 | 33.362 |

} අවම පළල අඩි 10 - දිග අඩි 870

මැනීම : 2012-10-07

2012-10-07
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තළමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

සැබෑ පිටපතකි.

..............................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

0 9 NOV 2012

# විවිධ දැන්වීම්

## නිවැරදි කිරීමයි

රජ්ගම ප්‍රාදේශීය සභාව

2018.10.12 වැනි දින පළකරන ලද අංක 2,093 දරන *ගැසට් පත්‍රයේ* පළවූ පහත අංක සඳහන් නිවේදනවල අවසානයේ "ටී. නිමල්, ලේකම්, රජ්ගම ප්‍රාදේශීය සභාව" යනුවෙන් වැරදි ලෙස පළවී ඇති බැවින්, එය "ටී. නිමල්, සභාපති, රජ්ගම ප්‍රාදේශීය සභාව" යනුවෙන් නිවැරදි විය යුතුය.

* 403/1, 403/4, 403/8, 403/9, 403/10, 43/11, 403/12.

වීරසේන ජයවර්ධන,
ලේකම්,
රජ්ගම ප්‍රාදේශීය සභාව,
රජ්ගම.

2018 ඔක්තෝබර් මස 19 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

11-566

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 23 පරිදි පහත සඳහන් ව්‍යාපාර බදු අය කිරීමට යෝජනා කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනෙවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### යෝජනාව

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදයම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකය සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද, සහ

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ, (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්-වන සෑම තැනැත්තකු විසින්ම යථෝක්ත බද්ද 2019-03-31 දිනට ප්‍රථම පදියතලාව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද ප්‍රාදේශීය සභාව නිවේදනය කරයි.

**ඉහත කී උපලේඛනය**

| | I වන තීරුව 2018 වර්ෂයේ දී ආදායම | II තීරුව රු. ශත |
|---|---|---|
| (i) | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| (ii) | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| (iii) | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| (iv) | රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| (v) | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| (vi) | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

*බදු සඳහා අදාල වන ව්‍යාපාර :*

01. ග්‍රෝස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කර තැබීම
02. උළු විකිණීමේ හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. රථ වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. විදුලි උපකරණ, ගුවන් විදුලි, කැසට්, රූපවාහිනී යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. පාවහන් හා බෑග් වර්ග වෙළඳම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
07. මහන මැෂින් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
08. පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
09. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. රෙදි පිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. ලියාපදිංචි කළ පෞද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
12. නාන කාමර කට්ටල් හෝ සෙරමික් නිෂ්පාදන භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
13. පුවත්පත්, ලිපිද්‍රව්‍ය, පාසල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. වතුර පොම්ප විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
15. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
16. සැලසුම් නිර්මාණය කරන ස්ථානයක් පවත්වාගෙන යම.
17. පරිගණක හෝ යතුරු ලියන පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් හෝ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
20. ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. දැව හෝ වානේ ගෘහ භාණ්ඩ/දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22. රජය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. කාය වර්ධන මධ්‍යස්ථාන
24. පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි දැන්වීම් භාර ගැනීමේ හා රූපවාහිනී, ගුවන් විදුලි වැඩ සටහන් සෑදීම
25. ක්‍රීඩා භාණ්ඩ අලෙවිය
26. වෙන්දේසිකරුවන්
27. බ්‍රෝකර්වරුන්
28. රක්ෂණ ආයතන
29. බැංකු කටයුතු හා මූල්‍ය ආයතන
30. ෆිනෑන්ස් ආයතන
31. කොන්ත්‍රාත්කරුවන්
32. විදේශ රැකියා ආයතන
33. තරග ඔට්ටු භාර ගැනීමේ නියෝජිත
34. සිගරට් වෙළඳ නියෝජිත
35. පුද්ගලික සාත්තු නිවාස
36. දුරකථන අලෙවි සැලක්

37. පෞද්ගලික විගණකාධිකාරි ආයතනයක්
38. අපනයන හා ආනයන ඒජන්තවරු
39. නීතිඥවරුන්
40. වෛද්‍යවරුන්
41. ප්‍රවාහන නියෝජිතවරුන්
42. සැපයුම්කරුන්
43. දෘෂ්ටි පරීක්ෂකයින් හා ඇස්කණ්ණාඩි අලෙවිය
44. ආහාරපාන සපයන්නෝ
45. බලවේග පේෂකර්මාන්ත
46. බතික් කර්මාන්ත
47. බලයලත් උකස් ආයතන
48. බලපත්‍රලාභී මත්පැන්හල්
49. මෝටර් රථ වාහන වෙළඳම් කරන්නන්
50. රියදුරු පුහුණු කරන ආයතන
51. යතුරු පැදි, අත් ට්‍රැක්ටර් හා ත්‍රී රෝද රථ වෙළඳාම් කරන්නන්
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ආයතන
53. පෞද්ගලික අධ්‍යාපන ආයතන හා ළදරු පාසල් පවත්වාගෙන යන්නන්
54. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ඇඟලුම් කර්මාන්ත හිමියන්
55. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ යම් හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් පවත්වාගෙන යන්නන්
56. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථාන
57. දත් බඳින ස්ථාන
58. වැලිගොඩ දැමීම හා ප්‍රවාහනය
59. තරාදි කිරුම් මිනුම් උපකරණ අලෙවි කරන ස්ථානයක්

11 - 385/1

---

**පදියතලාව ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී ගන්නා ලද යෝජනාවට අනුව කර්මාන්ත බදු අය කර ගැනීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනෙවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**ඉහත කී තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පදියතලාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තකු විසින් යථොක්ත බද්ද 2019.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද යෝජනා කරමි.

| I වන තීරුව කර්මාන්තය | II වන තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|
| | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු.750 ඉක්මවන එහෙත් රු.1500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 01. යන්ත්‍ර මගින් කළු ගල් කැඩීම, පිපිරවීම හා විකිණීම | 500 0 | 750 0 | 1000 0 |
| 02. රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය | 500 0 | 750 0 | 1000 0 |
| 03. උළු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 04. මිරිස්මෝලක්, කුළු බඩු පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 05. වී මෝලක් පවත්වාගෙන යාම (කමත් රහිත) | 500 0 | 750 0 | 1000 0 |
| 06. වී මෝලක් පවත්වාගෙන යාම (කමත් සහිත) | 500 0 | 750 0 | 1000 0 |
| 07. වී මෝලක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණය) | 500 0 | 750 0 | 1000 0 |
| 08. වී මෝලක් පවත්වාගෙන යාම (කුඩා ප්‍රමාණය) | 500 0 | 750 0 | 1000 0 |
| 09. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන කර්මාන්ත ශාලාවක් | 500 0 | 750 0 | 1000 0 |
| 10. කොන්ක්‍රීට් නිෂ්පාදනය (සිමෙන්ති ගල් ඇතුළුව) කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1000 0 |
| 11. ඇළුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 12. අතින් ලී ඉරන ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 13. ලීවලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම (වඩු කර්මාන්ත) | 500 0 | 750 0 | 1000 0 |
| 14. කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 15. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 16. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 17. ගඩොල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1000 0 |
| 18. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 19. කොමියුනිකේෂන් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 20. දුන්වීම්, ස්ටිකර් හා අකුරු කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 21. විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |

11 - 385/2

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 (1) "ආ" වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී ගන්නා ලද යෝජනාව පරිදි බලපත්‍ර ගාස්තු පැනවීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනෙවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පදියතලාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළයුතු යැයි යෝජනා කරමි.

| I වන තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | | II වන තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | රු. 750 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු.750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක<br>රු. ශත |
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කිරිගව පට්ටියක්, එළගව, ඌරන්, කුකුළන්, සුරතල් මසුන් ආදී සත්තු ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ගැළුම් 50 ට වැඩි පොල්තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගැළුම් 10 ට වැඩි එළවළු තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ග්‍රොස් 10 ට වැඩි ගිණි පෙට්ටි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යන්ත්‍රෝපකරණ සහිත ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | වඩු වැඩ කරන ස්ථානයක් ලෑලි විකිණීම, දර විකිණීම ආදී කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | හුණු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම (ගරාජ්) | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | බයිසිකල්, මෝටර් බයිසිකල්, ත්‍රී වීල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අම්ලකර වායුව පාවිච්චි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වයින්ස්ප්‍රීතු, මෙතිලේටඩ් විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | අයිස් ක්‍රීම්, යෝගට්, බීම පැකට්, ශීත කළ බීම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ශීතකරණවල තබා මස් වර්ග විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ඉන්දන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ගිනි කෙළි, රතිඤ්ඤා වැනි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වන තීරුව බලය දෙනු ලබන කාර්යය | II වන තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු.750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 30. | නිෂ්පාදනය කරන ලද ලී බඩු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | මාළු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | මස් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | හුණු අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ඕනෑම වර්ගයක් ජංගම වෙළඳ රථයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | එළවළු, පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | කිරි එකතු කරන හා විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ක්ෂණික ආහාර විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | පානීය ජල බෝතල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | කරවල විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ඔසුපැන්, කොළ කැඳ, කඩල, රටකජු, වේස්ට් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | බුලත්, පුවක් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | උත්සව භාණ්ඩ කුලියට දීමේ (හට්, තහඩු ආදිය) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ෆාමසි, රසායනාගාර ආදී ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | DVD, VCD කුලියට දීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | මිනී පෙට්ටි සාප්පු, මරණාධාර සේවාවන්, මංගල අවමංගල සේවාවන් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ටයර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | දත් බඳින, ඇස් කණ්නාඩි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | තීන්ත වර්ග අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | රබර් ලාංඡන සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | සමූපකාර සංගම් (කෝප්සිටියක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | පරණ යකඩ, හිස් බෝතල්, පරණ ප්ලාස්ටික්, පත්තර ආදිය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | සංගීත භාණ්ඩ කුලියට දීම හෝ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | විසිතුරු පැල පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | රස කැවිලි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

## පදියතලාව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 26 පරිදි වාහන හා සතුන් පිළිබඳ බදු ගැනීමට යෝජනා කරමි.

දේශමාන්‍ය, දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### ඉහත කී තීරණය

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙක් ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද, සහ

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ, (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තකු විසින් ම යථෝක්ත බද්ද 2019.03.31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද තීරණය කරමි.

*උපලේඛනය :*

| | | *I* වන තීරුව | *II* තීරුව<br>රු. ශත |
|---|---|---|---|
| 01. | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | | *(අ)* වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 25 0 |
| | | *(ආ)* වෙළඳ කාර්ය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 25 0 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 50 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| | (vi) | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| | (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

03. මේ උපලේඛනයෙහි වෙළඳ කාර්යය, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11 - 385/4

## පදියතලාව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සතිපොළ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජුලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 27 පරිදි පහත සඳහන් බදු පැනවීමට යෝජනා කරමි.

දේශමාන්‍ය, දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**ඉහත කී යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය අනුව, (1) වන උපවගන්තිය අනුව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සති පොළෙහි ගාස්තු අය කිරීම සභාව විසින් සෘජුව වෙළඳ අයිතිය බදු දීමේ බදුකරු විසින් 2019 වර්ෂය වෙනුවෙන් ගාස්තු අය කිරීමට හා ප්‍රධාන පාර දෙපස වෙළඳාම් කිරීම තහනම් බවත්, අළුතින් සකස් කර ඇති පොළ භූමියේ පමණක් වෙළඳාම් කිරීම කරන බවටත්, එකඟතාවය ඇතිව පොළ බදු දීමටත්, එම සීමාව තුළ පොළ භූමියට ගෙන එනු ලබන කිසිඳු තොගයක්, භාණ්ඩයක් පොළ භූමියෙන් පිටත මිලදී ගැනීමක්, විකිණීමක් නීත්‍යානුකූල නොවන බවටත්, කිසිඳු විටක මාර්ග අවහිර වන ආකාරයට වාහන ගාල් කර නොතබන ලෙසටත්, 2018.07.18 වැනි දින ගන්නා ලද මාගේ තීරණය මෙයින් නිවේදනය කරමි.

*පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සති පොළෙහි වෙළඳුන්ගෙන් අය කළ හැකි උපරිම ගාස්තු ඃ*

| | | *රු. ශත* |
|---|---|---|
| (1) | විවෘත කඩ (භූමියේ වර්ග අඩි 01) | 5.00 |
| (2) | වෙළඳ පාපැදියක් සඳහා | 100 0 |
| (3) | වෙළඳ යතුරුපැදියක් සඳහා | 250 0 |
| (4) | වෙළඳ අත් ට්‍රැක්ටරයක් සඳහා | 500 0 |
| (5) | වෙළඳ ලොරියක් සඳහා | 750 0 |
| (6) | වෙළඳ වෑන් රථයක් සඳහා | 750 0 |
| (7) | මාළු ලෑල්ලක් සඳහා (ලොරි සහ වෑන්) | 750 0 |

11 - 385/5

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

පදියතලාව ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුළියට දීම පිළිබඳ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභාව සතු පහත දැක්වෙන වාහන හා යන්ත්‍රෝපකරණ පහත දැක්වෙන මිල ගණන් යටතේ කුළියට දීමටද, ඒ තුළින් සභා අරමුදලට යම් දයකත්වයක් ලබා දීමටත්, 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 28 යටතේ පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය, දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| | | | | රු. ශත |
| (1) | JCB යන්ත්‍රය කුළියට දීම | - | පැයකට | 3000.00 |
| (2) | ජල බවුසරය කුළියට දීම (බවුසරය පමණක්) | - | දිනකට | 500.00 |
| (3) | ට්‍රැක්ටරය ටේලරය සමග කුළියට දීම | - | දිනකට | 4000.00 |
| (4) | රෝලර් යන්ත්‍රය කුළියට දීම | - | දිනකට | 3000.00 |
| (5) | ට්‍රැක්ටර් රථය බවුසරය සමග ජල සේවාව වෙනුවෙන් කි.මී. 01 කට (ජලය සභාව මගින් සපයන්නේ නැත) | - | | 100.00 |

(6) කෘෂ කැබ් රථය කුළියට දීම - දිනකට රු. 5000.00 ක් හෝ කි.මී. 01 කට රු. 50.00 ක් යන දෙකෙන් වැඩි අගය මත.

(7) ටිපර් රථය කුළියට දීම - දිනකට රු. 7500.00 ක් හෝ කි.මී. 01 කට රු. 75.00 ක් යන දෙකෙන් වැඩි අගය.

11 - 385/6

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ජල නල එලීම්වලදී මාර්ගය පළුදු කිරීම් සම්බන්ධ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශීය සභාව මගින් ඉදිකල හා නඩත්තු කරනු ලබන මාර්ගවල ජල නල එලීම් කටයුතු සඳහා පළුදු කිරීම්වලදී පහත දැක්වෙන ගාස්තු අය කිරීමට කටයුතු කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව පැවරී ඇති බලතල අනුව 2019.01.01 වැනි දින සිට පනවා අය කිරීමට 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 29 යටතේ පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| | | *රු. ශත* |
| (1) 1M x 1M වලක් කැනීමක දී | - | 1250.00 |
| (2) අවම දිග මීටර් 01 ක නල එලීමකදී, | | |
| *(a)* මාර්ගය පළුදු කිරීම් වලදී තාර යෙදූ මාර්ග | - | 1250.00 |
| *(b)* මාර්ගය පළුදු කිරීම් වලදී කොන්ක්‍රීට් යෙදූ මාර්ග | - | 2500.00 |

| | | |
|---|---|---|
| (3) වැඩි වන සෑම මීටර් 01 කට අය කිරීම | | *රු. ශත* |
| *(a)* තාර යෙදූ මාර්ග | - | 500.00 |
| *(b)* කොන්ක්‍රීට් යෙදූ මාර්ග | - | 750.00 |

දේශමාන්‍ය, දේශබන්දු,<br>
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,<br>
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,<br>
පදියතලාව ප්‍රාදේශීය සභාව,<br>
පදියතලාව.

11 - 385/7

F 4 - B 81466 (S)

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ජූලි මස 18 වන දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 30 යටතේ පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,<br>
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,<br>
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,<br>
පදියතලාව ප්‍රාදේශීය සභාව,<br>
පදියතලාව.

#### ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකර ඇති සිව්වන අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර පදියතලාව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් අවසරපත්‍රයක් ලබා ගත යුතු අතර, ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2019 වසර සඳහා පනවා 2019.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

#### උපලේඛනය

(1) බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා

- ❖ වර්ග අඩි 01 කට අවුරුද්දකට - රු. 100/-

(2) ප්‍රචාරක දැන්වීමක් (බැනර්) ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් එක් දැන්වීමකට

| | රු. ශත |
|---|---|
| ❖ වර්ග අඩි 01 කට වැඩිමුත් දින 07 ක් නොඉක්මවන විට | 150.00 |
| ❖ දින 07 සිට දින 14 දක්වා වර්ග අඩි 01 කට | 200.00 |
| ❖ දින 14 සිට දින 30 දක්වා වර්ග අඩි 01 කට | 300.00 |
| ❖ දින 30 සිට මාස 06 දක්වා වර්ග අඩි 01 කට | 400.00 |
| ❖ මාස 06 ක් ඉක්මවන විට වර්ග අඩි 01 කට | 500.00 |

(3) ස්ථිර දැන්වීම් පුවරු

| | රු. ශත |
|---|---|
| ❖ විනිවිද පෙනෙන/ විදුලි ආලෝකනය කරන ලද වර්ග අඩියකට | 250.00 |
| ❖ විනිවිද පෙනෙන/ විදුලි ආලෝකනය නොකරන ලද වර්ග අඩියකට ඉටිරෙදි හෝ රෙදි මගින් කරන ලද දැන්වීම් සඳහා | 200.00 |
| ❖ වානිජ දැන්වීම් සඳහා වර්ග අඩියකට | 150.00 |
| ❖ වෙනත් විවිධ සුබසාධන කටයුතු සඳහා වර්ග අඩියකට | 100.00 |

11 - 385/8

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු පැනවීම 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන පළාත් සභා *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස් ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව (260 වන අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 31 පරිදි පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

#### ඉහත කී තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරනු ලදුව (260 වන අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.01.01 වැනි දින සිට පදියතලාව ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත උපලේඛනයේ දක්වෙන ගාස්තු මෙම සභාව වෙත අය කිරීමට 2018.07.18 දින ගන්නා ලද බව යෝජනා කරමි.

#### උපලේඛනය I

#### ගොඩනැගිලි ඉදිකිරීම

| | | පදිංචිය සඳහා<br>රු. ශත | වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා<br>රු. ශත |
|---|---|---|---|
| 1. | 750 හෝ ඊට අඩු | 500 0 | 750 0 |
| 2. | 751 හෝ 1,000 දක්වා | 750 0 | 1,000 0 |
| 3. | 1,001 හෝ 1,100 දක්වා | 1,000 0 | 1,250 0 |
| 4. | 1,101 හෝ 1,500 දක්වා | 1,250 0 | 1,750 0 |
| 5. | 1,501 හෝ 2,000 දක්වා | 1,500 0 | 2,250 0 |
| 6. | 2,001 හෝ 2,500 දක්වා | 2,000 0 | 2,750 0 |
| 7. | 2,501 හෝ 3,000 දක්වා | 2,500 0 | 3,500 0 |
| 8. | 3,001 හෝ 3,500 දක්වා | 3,000 0 | 4,250 0 |
| 9. | 3,501 හෝ 4,000 දක්වා | 4,000 0 | 5,000 0 |
| 10. | 4,001 හෝ 5,000 දක්වා | 5,000 0 | 6,500 0 |
| 11. | 5,001 හෝ 6,000 දක්වා | 6,000 0 | 8,000 0 |
| 12. | 6,001 හෝ 8,000 දක්වා | 8,000 0 | 10,000 0 |
| 13. | 8,001 හෝ 10,000 දක්වා | 10,000 0 | 20,000 0 |
| 14. | 10,000 ට වැඩි සෑම වර්ග අඩි 01 ක් සඳහා | 40 0 | 100 0 |

11 - 385/9

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### සභාව සතු ක්‍රීඩා භූමි බදු දීමේ දී ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

සභා සීමාව තුළ පෞද්ගලික ඉඩමක හෝ විනෝද සංදර්ශන, ක්‍රීඩා සංදර්ශන, සංගීත සංදර්ශන ආදිය ප්‍රදර්ශනය කිරීමේ දී ගාස්තු අය කිරීම -

මෙහි පහත දැක්වෙන ගාස්තු 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී ගන්නා ලද යෝජනා අංක 32 අනුව ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### උපලේඛනය

සභාව සතු දේපළ සම්බන්ධයෙන්

| | | රු. ශත |
|---|---|---|
| ➢ | පොළ භූමිය සංදර්ශන සඳහා දිනකට බදු දීම | 1,000 0 |
| ➢ | මුදල් අයකරන සංදර්ශන සඳහා දිනකට | 500 0 |
| ➢ | ආපසු ගෙවන ඇප | 3,500 0 |
| ➢ | ආපසු නොගෙවන ඇප | 1,000 0 |
| ➢ | සුභ සාධක කටයුතු සඳහා | 200 0 |
| | සභා සීමාව තුළ පෞද්ගලික ඉඩම් තුළ පවත්වන සංදර්ශන සඳහා | |
| ➢ | ඕනෑම සංදර්ශනයක් සඳහා දිනකට | 500.00 |

11 - 385/10

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ඉඩම් අනු බෙදීම්/ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම - 2019 වර්ෂය

නාගරික සංවර්ධන ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009.04.16 වැනි දින කොළඹදී රජයේ නිවේදන එල්.ඩී.බී. 16/78 යටතේ ප්‍රකාශයට පත් කරන ලද අංක 1597/8 හා 2009 අප්‍රේල් මස 17 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පස්වැනි (V) උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂයට බලපාන පරිදි පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පනවා 2019.01.01 දින සිට අය කිරීමට 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 33 පරිදි පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| (i) | ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 400.00 |
| (ii) | පදිංචි ස්ථාන සඳහා | 350.00 |

| | | |
|---|---|---|
| (iii) | ඉඩම් අනුබෙදුම සඳහා | |
| | නේවාසික | 350.00 |
| | ව්‍යාපාරික (වෙන්දේසි) | 500.00 |
| 02. | ගොඩනැගිලි අයදුම්පත්‍ර සම්බන්ධ සහතික පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | 300.00 |
| 03. | අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීම | |
| | පළමු අවුරුද්ද සඳහා | 200.00 |
| | දෙවන අවුරුද්ද සඳහා | 250.00 |
| | තෙවන අවුරුද්ද සඳහා | 300.00 |

උපරිම කාලය වසර 03 කි. අවුරුදු 03 කට පසු සැලැස්ම අළුත් කරගත යුතුවේ.

11 - 385/11

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### පුස්තකාල සේවාවන් මත ගාස්තු අයකිරීම

2018.07.18 දිනැති ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 38 යටතේ පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

| | | රු. ශත |
|---|---|---|
| 1) | සාමාජික අයදුම්පතක් (වර්ෂයකට) | 25.00 |
| 2) | එක් අයකුගේ ඇප තැන්පත් වර්ෂයකට | 75.00 |
| 3) | ප්‍රමාද ගාස්තු දිනකට | 01.00 |

4) පොතක් අස්ථානගත වූ විට පොතේ වටිනාකම මෙන් දෙගුණයක් හා ඊට අමතරව පොතේ වටිනාකමින් 30% ක් අය කරනු ලැබේ.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

11 - 385/12

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුප්‍රාප්තිකයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීම මත ලද මුදලින් 1% ක බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජක විසින් පදියතලාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට නියම කිරීමට 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 34 වන යෝජනා මත බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 154(1) වගන්තිය යටතේ ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

11 - 385/13

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### සුසාන භූමි ආඥාපනත 231 අධිකාරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා සුසාන භූමි ආඥාපනත 03 වගන්තිය හා 17 සිට 22 වගන්ති අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මතු දැක්වෙන උපලේඛනයේ සඳහන් සුසාන භූමිවල භූමදාන කිරීමක්, ආදාහන කිරීමක්, තැන්පත් කිරීමක් හා ස්මාරකයක් ඉදිකිරීමක් සඳහා පහත සඳහන් ගාස්තු 2018.07.18 වැනි දින, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද යෝජනා අංක 35 යටතේ යෝජනා කළ බව මින් මහජනයාගේ දැන ගැනීම සඳහා නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු,
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

සුසාන භූමි පිළිබඳ උපලේඛනය

| අනු අංකය | ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ නම | සොහොන් භූමි පිහිටි ස්ථාන (අක්කර 02 බැගින්) 01 | 02 | 03 |
|---|---|---|---|---|
| 01 | සේරංකඩ | සේරංකඩ | - | - |
| 02 | මොරදෙණිය | මොරදෙණිය | කොළාන්යාය | - |
| 03 | පළතුරුවැල්ල | පළතුරුවැල්ල (ප්‍රධාන මාර්ගය අසල) | - | - |
| 04 | පුළුන්ගස්මුල්ල | පුළුන්ගස්මුල්ල | - | - |
| 05 | හෝලිකේ | හෝලිකේ වේකුරුල්ල | හතුකුඹුර | වලබැද්ද |
| 06 | මිරිස්වත්ත | කෙම්මලපිටිය | කෙසෙල්පැලේබැද්ද | - |
| 07 | කොළමන්තලාව | කොළමන්තලාව | - | - |
| 08 | දෙරකුඹුර | දෙරකුඹුර | වහව | - |
| 09 | මරංගල | මරංගල | කීනාතුමුල්ල | - |
| 10 | කෝමාණ | කෝමාණ | හෙලකෝමාණ | මාරාව |
| 11 | කෙහෙල්උල්ල | 51 කණුව | බෝගරාව | - |
| 12 | පදියතලාව | 56 කණුව | - | - |
| 13 | තලාපිටඔය දකුණ | කොකුමාවර | - | - |
| 14 | කිරවාන | වැලිකුඹුර | ඇහැලඅතුමුල්ල | දංගමුව |
| 15 | තලාපිටඔය වම | හෝලිකේ පාර | කැලේලිද වතුයාය | - |
| 16 | පල්ලේගම | පල්ලේගම | පදවල | - |
| 17 | ගල්ඔඩේ | ළිඳගල | උණගස්ලන්ද | - |
| 18 | උනාපාන | නාවින්න | - | - |
| 19 | හාගම්වෙල | කුඹුරුවෙල | මාවුන්නවෙල | - |
| 20 | සරණගම | ප්‍රජා ශාලාව අසල | තපස්සිරියාය | - |

**ගාස්තු පිළිබඳ විස්තර**

වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් සඳහා ගාස්තුව - රු. 3500.00
ස්මාරකයක් ඉදිකිරීම වර්ග අඩි එකකට රු. 500.00 බැගින් (උපරිම වර්ග අඩි 10)

- තවද භූමදන කටයුතු ඉටු කිරීමේ දී ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 30 ක් ද අතුරු මාර්ගයේ සිට මීටර් 10 ක් පසු පසට භූමදන කටයුතු සිදුකළ යුතුය.

- තැන්පත් කිරීම් වලදී මීටර් 30 ක් සුසාන භූමි ඉඩම හා මාර්ගය අතර දුර ප්‍රමාණයක සිට තැන්පත් කිරීම් කළ යුතු අතර ස්මාරක ඉදි කිරීමේ දී එකී දුර ප්‍රමාණයේ සිට කළ යුතු වේ. ප්‍රාදේශීය සභාව මගින් පෙන්වා දෙනු ලබන ස්ථානයේ තැන්පත් කිරීම් සිදුකළ යුතුය.

- සුසාන භූමියට අක්කර 02 ක භූමි භාගයක් ඇති හෙයින් හැකිතරම් ඉඩමේ පසු පසට වන්නට තැන්පත් කිරීම් කළ යුතු අතර භූමිය සීමිත හෙයින් උපරිම ප්‍රයෝජන ගැනීමට වග බලා ගත යුතු වේ.

11 - 385/14

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට කුලී රථ ලියාපදිංචි කිරීම හා අවසරපත් ගාස්තු පැනවීම

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පදියතලාව නගරය, සේරංකඩ නගරය, ගල්ඔබේ නගරවල ගාල් කර ඇති ත්‍රී රෝද රථ, ඩිමෝ බට්ටා ලොරි, ට්‍රැක්ටර් හා භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ පටවන හා භාණ්ඩ බහාලන ලොරි රථ, මඟී බස්රථ වලින් රථවාහන ගාස්තුවක් පහත උපලේඛනයේ පරිදි අයකිරීමට,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් පදියතලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව

2018.07.18 වැනි දින යෝජනා අංක 36 යටතේ ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

දේශමාන්‍ය දේශබන්දු,
| 44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. පාසල් රට හුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

***II වැනි උපලේඛනය***

*අන්තරාදායක ව්‍යාපාර ඃ*

| | | | |
|---|---|---|---|
| 1. කළු ගල් කැණීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. එළවළු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. පොල් තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. තේ පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 0ට වැඩි එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 8. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. හිරිගල් හෝ හුණු ගල් කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මල් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. විසිරි පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ ආයුධ උපකරණ නිපදවීම) | 500 0 | 750 0 | 1,000 0 |

## ***III* වැනි උපලේඛනය**

*අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :*

| | | | |
|---|---|---|---|
| 1. තලාතු මිනිරන් සුද්ද කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. තෙල් හෝ සත්ව මේද නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. හුණු ගල් හෝ හිරි ගල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. ගිණි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. මෝර තෙල් සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. බෝට්ටු තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. ලෝහ වර්ග පෑස්සවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. මෝටර් වාහන බෝඩි තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. කෘමිනාශක, දිලීර නාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. විෂබීජනාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. මදුරු දඟර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නිකවැරටිය ප්‍රදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (02) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ව්‍යාපාර බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වගන්තියක් නොවන්නා වූ මෙකී උපලේඛනය යම් ව්‍යාපාරයක් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තකුගේම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක යලි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක්, 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී බද්දට යටත් යම් තැනැත්තෙකු එම ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය I*

| *I වැනි තීරුව*<br>*ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු වාර්ෂික බද්ද*<br>*රු. ශත* |
|---|---|
| 01. රු. 100 සිට රු. 6,000 දක්වා | නැත |
| 02. රු. 6,000 සිට රු. 12,000 දක්වා | 90 |
| 03. රු. 12,000 සිට රු. 18,750 දක්වා | 180 |
| 04. රු 18,750 සිට රු. 75,000 දක්වා | 360 |
| 05. රු. 75,000 සිට රු. 1,50,000 දක්වා | 1,200 |
| 06. රු. 1,50,000 ඉක්මවන | 3,000 |

*උපලේඛනය II*

*අදාළ ව්‍යාපාර නාමයන් :*

01. ලී වෙළෙඳසලක් සඳහා
02. සිල්ලර වෙළෙඳසලක්
03. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
04. ශබ්දවාහිනි යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් සඳහා
05. ඉංග්‍රීසි බෙහෙත් විකුණන ස්ථානයක් (ෆාමසියක්) සඳහා
06. තොග වෙළෙඳසලක් සඳහා
07. තීන්ත වර්ග ගබඩා කිරීම සහ විකිණීම
08. යතුරු පැදි අලෙවි කරන ස්ථානයක් සඳහා
09. පින්තූර රාමු කරන ස්ථානයක් සඳහා

10. ඡායා පිටපත් යන්ත්‍ර තබාගැනීමේ ස්ථානයක් සඳහා
11. පිඟන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් සඳහා
12. ටයර් සහ ටියුබ් වෙළෙඳාම් කරන ස්ථානයක් සඳහා
13. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා
14. විකිණීම සඳහා මහන මැෂින්, ශීතකරණ තබාගන්නා ස්ථානයක් සඳහා
15. පාපැදි අමතර කොටස් අලෙවි කිරීම හා ගබඩා කිරීම
16. ගීත පටිගත කරන ස්ථානයක් (රේකෝඩ් බාර්) සඳහා
17. ප්ලාස්ටික් බඩු විකුණන ස්ථානයක් සඳහා
18. ගොඩනැගිලි උපකරණ අලෙවි කරන ස්ථානයක් සඳහා
19. ඇළුමිනියම් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් සඳහා
20. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා
21. යතුරු පැදි අමතර කොටස් අලෙවි කිරීම සහ ගබඩා කිරීම සඳහා
22. ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක් සඳහා
23. ග්‍රොසරියක් පවත්වාගෙන යාම සඳහා
24. විදුලි උපකරණ අලෙවි කරන ස්ථානයක් සඳහා
25. ජංගම දුරකථන සහ එම අමතර කොටස් අලෙවිය සඳහා
26. මෝටර් රථ අමතර කොටස් අලෙවිය සඳහා
27. පොල් මිලදී ගැනීමේ ස්ථානයක් සඳහා
28. ආයුර්වේද රසායනාගාරයක් පවත්වාගෙන යාම සඳහා
29. විසිතුරු පැල වර්ග විකිණීම සඳහා
30. රෙදි පිළි, නිමි ඇඳුම් අලෙවි කරන ස්ථානයක් සඳහා
31. කොමියුනිකේෂන් එකක් පවත්වාගෙන යාම සඳහා
32. ප්‍රචාරක දැන්වීම් සකස් කරන වෙළෙඳ ස්ථානයක් සඳහා
33. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා
34. වී මෝලක් සඳහා
35. විදුලි භාණ්ඩ අළුත්වැඩියා කරන ස්ථානයක් සඳහා
36. ජුකී මැෂින් පුහුණු කරන ස්ථානයක් සඳහා
37. යකඩ නිකල් කිරීමේ ස්ථානයක් සඳහා
38. ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය සඳහා
39. බැටරි අලෙවි කිරීමේ ස්ථානයන් පවත්වාගෙන යාම
40. ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම
41. අවමංගල්‍ය භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
43. පරිගණක මෘදුකාංග නිෂ්පාදනය කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. රක්ෂණ නියෝජිතයින්
45. පෞද්ගලික ප්‍රවාහන සේවා සපයන්නන්
46. පෞද්ගලික පංති පවත්වන්නන්
47. උකස් භාණ්ඩ ලබාගන්නන්
48. කොන්ත්‍රාත්කරුවන්
49. රටබීම අලෙවි කරන්නන්
50. කොමිස් ඒජන්තවරු
51. නොතාරිස්වරුන්, මිනින්දෝරුවන්, වෛද්‍යවරුන්
52. පෞද්ගලික බස්රථ හිමියන්
53. රියැදුරු පුහුණු කරන ආයතන පවත්වන්නන්
54. කුළී රථ හිමියන්
55. ලොතරැයි නියෝජිතයින්
56. මුදල් ආයෝජකයින්
57. රැකියා ඒජන්තවරුන්
58. සැපයුම්කරුවන්
59. පෞද්ගලික දේපළ වෙළෙඳ සමාගම් හිමිකරුවන්
60. ඇඟළුම් කර්මාන්තශාලා හිමිකරුවන්
61. වාහන ප්‍රදර්ශනාගාර හිමිකරුවන්
62. ගල් ක්‍රෂර් යන්ත්‍ර හිමිකරුවන්
63. උත්සව භාණ්ඩ සැපයීම

64. විදුලි සංදේශ කාර්යාල සහ කුළුණු
65. බණිජතෙල් ගබඩා කිරීම
66. කුළී රථ සේවා පහසුකම් සැපයීම
67. වැලිගොඩ දැමීමේ ස්ථාන
68. සිනමා ශාලා
69. විශේෂඥ වෛද්‍ය සේවා මධ්‍යස්ථාන
70. පුවත් පත් අලෙවි නියෝජිත ආයතන
71. මුදල් අයකරන පෞද්ගලික පෙර පාසල්
72. මුදල් අයකරනු ලබන ජාත්‍යන්තර පාසල්
73. ෆිනෑන්ස් ආයතන
74. විදේශ රැකියා ඒජන්සි
75. නීතිඥ සේවා සැපයීම
76. ගණන් පරීක්ෂකවරුන්
77. නිවාස සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරන්නන්
78. බොරළු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
79. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම

11 - 419/3

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### කර්මාන්ත බදු පැනවීම (2019)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (3) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**කර්මාන්ත බදු පැනවීම (2019)**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2019 වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර එකී බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි යෝජනා කරමි."

*උපලේඛනය*

*කර්මාන්ත බදු*

| *I වැනි තීරුව*<br>*කර්මාන්තය* | *II වැනි තීරුව*<br>*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 1 සිට රු. 750 දක්වා* | *රු. 751 සිට රු. 1,500 දක්වා* | *රු. 1,500ට වැඩි* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. පොල්ලෙලි කැබලි (කටර්) සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. ජලනල පද්ධති හා විදුලි කාර්මික සේවා කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* *කර්මාන්තය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 1 සිට රු. 750 දක්වා* | *රු. 751 සිට රු. 1,500 දක්වා* | *රු. 1,500ට වැඩි* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 03. සිසිල් බීම නිෂ්පාදනය හා ගබඩා කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. අභ්‍යාස පොත් නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. ප්ලාස්ටික් වතුර ටැංකි නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. වතුර බෝතල් නිෂ්පාදනය හා අලෙවි කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. විදුලි උපාංග නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. ගඩොල් නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

11 - 419/4

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

නිකවැරටිය 1 ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - 4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව 04**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලි, ඉඩම්වල හා ගෙපත්වල 2018 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට පහක (5%) වරිපනමක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 419/5

**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

නිකවැරටිය 1 ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 5 (iv) - (05) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී සභා සම්මතය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාර, වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත්, 2019 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව 05**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1990 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යොක්ෂණය කිරීම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ -

*(අ)* හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2019 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්;

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටසේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2019 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත් ; සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 419/6

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 5 (iv) - (06) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තකුගේම එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වාර්ෂික බද්දක් 2019 වර්ෂය සඳහා අය කළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛනය***

| *1 වැනි තීරුව* | *11 වැනි තීරුව* *රු. ශත* |
|---|---|
| (1) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් - | |
| (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (i) සෑම කරත්තයක් සඳහාම | 20 0 |
| (ii) සෑම අත් කරත්තයක් සඳහාම | 10 0 |
| (iii) සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (iv) සෑම ඇතකු, අලියකු සඳහාම | 50 0 |
| (v) සෑම රික්ෂෝවක් සඳහාම | 7 50 |
| (vi) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |

11 - 419/7

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම 2019

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 5 (iv) - (07) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**විනෝද බදු පැනවීම**

විනෝද බදු ආඥාපනතේ සඳහන් විධිවිධාන අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් විනෝද බදු හැර සියයට දහයක බදු ප්‍රතිශතයක් අය කිරීමට මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටියක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල් එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතයි දශම පහක් (7.5%) ක් ලෙස අඩු කිරීමටත් 2009.09.22 වැනි දිනැති මහ සභා රැස්වීමේ දී යෝජනා සම්මත කර ඇති අතර, එකී යෝජනාවට ගරු වයඹ ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බව වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ව/ප්‍රඅලේ/ආ08/64 හා 2011.01.31 දිනැති ලිපියෙන් දක්වා ඇති අතර එකී අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් පළකිරීමෙන් පසු එම *ගැසට් පත්‍රයේ* සඳහන් දින සිට නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අයකළ යුතු යැයි යෝජනා කරමි.

11 - 419/8

---

**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව (2019)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (08) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22(4) හා 122-126 වැනි වගන්තිවලින් නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම්,බැනර් ඇලවීම, ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයට පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරය* *විස්තරය* | *II වැනි තීරය* *අය කරන ගාස්තුව* | *රු. ශත* |
|---|---|---|
| 01. බිත්තියක හෝ තාප්පයක, පුවරුවක ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා (සෑම වසරකම ගෙවිය යුතුය) | වර්ග අඩියකට | 60 0 |
| 02. එක් මසකට වැඩි මාස තුනකට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 30 0 |
| 03. මාස එකක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 20 0 |
| 04. කටවුට් සඳහා මාස තුනකට වැඩි කාල සීමාවකට | වර්ග අඩියකට | 40 0 |

| *1 වැනි තීරය* *විස්තරය* | *11 වැනි තීරය* *අය කරන ගාස්තුව* | *රු. ශත* |
|---|---|---|
| 05. කටවුට් සඳහා මාස තුනකට අඩු කාල සීමාවකට | වර්ග අඩියකට | 30 0 |
| 06. සභාව සතු නිකවැරටිය නගරයේ ඇති භූමිය තාවකාලිකව වෙළෙඳ කුටි එළිමහන් ප්‍රදර්ශන පැවැත්වීම වෙනුවෙන් එක් දිනකට | වර්ග අඩියකට | 25 0 |

07. චිත්‍රපටි දර්ශන, ආධාර චිත්‍රපට දර්ශන, මැජික් සංදර්ශන, සර්කස්, නැටුම් සංදර්ශන, හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයකින්ම 10% ක බදු මුදලක් ගෙවිය යුතු ය.

08. ප්‍රසිද්ධ සංදර්ශන බලපත්‍ර ගාස්තුව එක් දිනක් සඳහා 500 0

11 - 419/9

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට අදාළව සේවා ගාස්තු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු 2019.01.01 දින සිට පනවා අය කිරීමට 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (09) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**සේවා සඳහා ගාස්තු අයකිරීම**

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා 2019.01.01 වැනි දින සිට 2019.12.31 වැනි දින දක්වා පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතු බවට නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරය* | *II වැනි තීරය* *රු. ශත* |
|---|---|
| 1. පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100 0 |
| 2. පරිසර ගාස්තු | වටිනාකම අනුව |
| 3. බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු | 50 0 |
| 4. පරිසර බලපත්‍ර ගාස්තු | 1250 0 |
| 5. සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පෙරසැරි ගාස්තු | වර්ග අඩි ප්‍රමාණය අනුව |

| *වර්ග ප්‍රමාණ* | *නිවාස* *රු. ශත* | *ව්‍යාපාර* *රු. ශත* |
|---|---|---|
| වර්ග අඩි 2000 දක්වා | 500 0 | 750 0 |
| වර්ග අඩි 2000 ට වැඩි සෑම වර්ග අඩි 100 සඳහා ම | 100 0 | 200 0 |

| | වර්ග අඩි ප්‍රමාණය අනුව | |
|---|---|---|
| *වර්ග ප්‍රමාණ* | *නිවාස* *රු. ශත* | *ව්‍යාපාර* *රු. ශත* |
| 6. අලුතින් ඉදිකරන තාප්ප සඳහා වර්ග අඩියකට | 2 0 | 4 0 |
| 7. වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 600 0 | |
| 8. වීථි රේඛා පරීක්ෂණ ගාස්තු | 500 0 | |
| 9. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 500 0 | |
| 10. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු පරීක්ෂා කිරීමේ ගාස්තු | 500 0 | |

11. ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර සහ වලංගු කාලය දීර්ඝ කිරීම උපරිමය වසර 3 දක්වා

| *කාලය* | *නිවාස* *රු. ශත* | *ව්‍යාපාර* *රු. ශත* |
|---|---|---|
| 1 වසර | 100 0 | 200 0 |
| 2 වසර | 200 0 | 300 0 |
| 3 වසර | 300 0 | 400 0 |

12. *සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල් අයකිරීම*

(i) තාප්ප සඳහා වර්ග අඩියකට පෙරසැරි ගාස්තු මෙන් දෙගුණයකි.

(ii) නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයෙන් පිටත අනවසරයෙන් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය දීමට ගාස්තු අයකිරීම.

| *විස්තරය* *(වර්ග මීටරයක් සඳහා)* | *නේවාසික ව්‍යාපාර* *රු. ශත* | *ව්‍යාපාර* *රු. ශත* |
|---|---|---|
| (i) අත්තිවාරම සම්පූර්ණ කර ඇති විට | 25 0 | 25 0 |
| (ii) වහල මට්ටම දක්වා | 40 0 | 50 0 |
| (iii) වහලය ඇතුළුව ඉදි කොට ඇති විට | 60 0 | 100 0 |
| (iv) සම්පූර්ණයෙන්ම වැඩ නිමකොට ඇති විට | 100 0 | 150 0 |
| 13. අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව | 1,000 0 | 2,000 0 |

14. සතිපොල කඩ කාමර සඳහා ගාස්තු අය කිරීම -

(i) අඩි 08 x අඩි 06 ප්‍රමාණයේ කඩ කාමර සඳහා 200 0
(ii) විවෘත භූමිය අඩි 08 x අඩි 06 සඳහා 150 0

| *ප්‍රාදේශීය සභාවේ වෙනත් ගාස්තු* | | *රු. ශත* |
|---|---|---|
| පුස්තකාල සාමාජික ගාස්තු | වැඩිහිටි | 75 0 |
| | ළමා | 50 0 |
| ටෙන්ඩර් දඩ දිනකට | | 10% |
| පිඹුරු අනුමත කිරීමේ ගාස්තු | | 500 0 |
| පුස්තකාල අයදුම්පත් ගාස්තු | | 15 0 |
| තක්සේරු ලේඛනයෙහි නම වෙනස් කිරීමේ ගාස්තු | | 150 0 |

15. *ඉඩම් කට්ටි සැලැස්ම හෝ අනු බෙදුම අනුමත කර දීමේ ගාස්තු අයකිරීම -*

| *ප්‍රමාණය* | *සංවර්ධන සැලැස්ම රු. ශ* | *අනු බෙදුම රු. ශත* | *සේවා ගාස්තු රු. ශත* |
|---|---|---|---|
| හෙක්ටයාර් 1ට අඩු | 250 0 | 250 0 | එක් කාර්යයක් සඳහා රු.750 |
| හෙක්ටයාර් 01 - 02 | 350 0 | 350 0 | එම |
| හෙක්ටයාර් 02-04 | 500 0 | 500 0 | එම |
| හෙක්ටයාර් 04ට වැඩි | 750 0 | 750 0 | එම |

16. සභා බලප්‍රදේශයේ අනුමැතියට පෙර ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු සඳහා (කුළුණු ධාරිතාව කියුබික් මීටර් ) x 200.00 යන පදනමින් දඩ මුදල් අයකරනු ලැබේ.

17. ආදාහනාගාර ගාස්තු අයකිරීම.

| | | | |
|---|---|---|---|
| (i) | බල ප්‍රදේශය තුළ | - | 7,000 0 |
| (ii) | බල ප්‍රදේශයෙන් පිට | - | 8,000 0 |

11 - 419/10

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව (2019)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (10) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක 1703 /18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වැනි දින පැවති මහ සභාව විසින් පිළිගෙන අංක 1785 හා 2012.11.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසෙන් නිවේදනය කර ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| *1 වැනි තීරය* | *11 වැනි තීරය එක් වරක් පමණක් ගෙවන වාර්ෂික ගාස්තුව රු. ශත* | *111 වැනි තීරය නවතා තැබීමේ ගාස්තුව දිනකට රු. ශත* |
|---|---|---|
| 01. සෑම මගී ප්‍රවාහන බස් රථයක් සඳහාම | 1,000 0 | 50 0 |
| සෑම ත්‍රීරෝද රථයක් සඳහාම | 900 0 | 50 0 |
| මගී ප්‍රවාහන බස් රථ, ත්‍රිරෝද රථ නොවන වෙනත් වාහන සඳහා | 900 0 | 50 0 |

02. මේ සෑම මුදලක්ම මාසයේ ආරම්භක දිනයේ සම්පූර්ණ මාසය වෙනුවෙන්ම ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ද ලබා දෙනු ලැබේ.

03. කුලී ගමන් අපේක්ෂාවෙන් තොරව ප්‍රාදේශීය සභා භූමිය තුළ පිහිටි රථගාලකට පැයකට අධික කාලයක් නවතා තබන ලද වාහනයකින් රු. 50.00 ක මුදලක්ද යතුරු පැදියකින් රු. 25.00ක මුදලක්ද අයකරනු ලැබේ.

11 - 419/11

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### සංචාරක වෙළෙඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව (2019)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (11) යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පි. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**සංචාරක වෙළෙඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව**

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටකෙරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බව 2011.04.28 දිනැති අංක 1703 /18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති සංචාරක වෙළෙඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වැනි දින පැවති මහ සභාව විසින් පිළිගෙන අංක 1785 IV(අ) කොටසෙහි නිවේදනය කර ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සංචාරක වෙළෙඳ බලපත්‍රයක් සඳහා 2019 වර්ෂයට ගාස්තුවක් අයකළයුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* *අනු. අංකය* | *II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* *රු. 01 සිට රු. 750 දක්වා රු. ශත* | *රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *රු. 1,500 ට වැඩි රු. ශත* |
|---|---|---|---|
| 01. තැඹිලි, කුරුම්බා වෙළෙඳාම | 200 0 | 400 0 | 600 0 |
| 02. කඩල වඩේ, මුරුක්කු, බයිට්ස් පැකට් වෙළෙඳාම | 200 0 | 400 0 | 600 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *අනු. අංකය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 01 සිට රු. 750 දක්වා රු. ශත* | *රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *රු. 1,500 ට වැඩි රු. ශත* |
| 03. විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 04. බිම්මල් අලෙවිය | 200 0 | 400 0 | 600 0 |
| 05. රෙදි අලෙවිය | 300 0 | 500 0 | 800 0 |
| 06. පාවහන් වෙළෙඳාම | 300 0 | 500 0 | 750 0 |
| 07. සාප්පු බඩු අලෙවිය | 300 0 | 500 0 | 750 0 |
| 08. මල්පැල, එළවළු පැල හා පළතුරු පැල අලෙවිය | 250 0 | 500 0 | 750 0 |
| 09. පොත් , පත්තර වෙළෙඳාම | 300 0 | 500 0 | 750 0 |
| 10. ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. ධාන්‍ය වර්ග පැකට්කර විකිණීම | 300 0 | 500 0 | 750 0 |
| 12. එළවළු හා පළතුරු වෙළෙඳාම | 200 0 | 400 0 | 600 0 |
| 13. කෘත්‍රිම මල් අලෙවිය | 300 0 | 500 0 | 750 0 |
| 14. ජංගම බැංකු සේවා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. පහන්තිර, හඳුන්කූරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය | 200 0 | 400 0 | 600 0 |
| 16. ලොතරැයි අලෙවිය | 200 0 | 400 0 | 600 0 |
| 17. ඔරලෝසු වෙළෙඳාම | 250 0 | 500 0 | 750 0 |

11- 419/12

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත බදු අයකිරීම (2019)

නිකවැරටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2019 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අයකිරීමට 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (12) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු අයකිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්කරුවෙකු විසින් ඔවුන්ගේ සේවකයා විසින් නැතහොත් නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ, නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එම විකිණීමෙන් ලැබෙන මුදලින් (1%) බද්දක් 2019 වර්ෂයට පනවා අයකිරීමට තීරණය කර ඇති බවත්, එම බද්ද ගෙවීමට අදාළ ඉඩම් විකුණූ වර්ෂය අවසානයට පෙර අයවිය යුතු බවත්, මෙයින් යෝජනා කරන්නීය.

11- 419/13

### නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (iv) - (13) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක ; හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය (20 ට 1 ) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 1% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළයුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

11 - 419/14

---

### කොටපොල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු යෝජනාව 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක 2018 වර්ෂයේදී බල පැවැත්වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගෙන එම වටිනාකමින් 6%ක ප්‍රතිශතයක් වරිපනම් බද්දක් ලෙස 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට කොටපොල ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක 2018 වර්ෂයේදී බල පැවැත්වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්.

(ආ) 134 වැනි වගන්තියේ (06) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යතෝක්ථ වාර්ෂික වරිපනම් බද්ද 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:1 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

418/1

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

අක්කර බදු යෝජනාව 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටියා වූ එක් එක් ඉඩම් හෙක්ටයාරය මත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට කොටපොල ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී උපවග්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රය* පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 01ට නොඅඩු එහෙත් හෙක්ටයාර් 5ට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (රු. 50) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (රු. 10) බැගින් වූ අක්කර බද්දක් 2019 වර්ෂයේ පනය අය කිරීමට සහ,

(ආ) 134 වන වගන්තියේ (06) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යතෝක්ථ බද්ද 2019 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින්

ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:2 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 418/2

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

ව්‍යාපාර බදු යෝජනාව 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ වෘත්තිකයන් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ පළමුවන තීරයේ නිරූපිත යම් විෂයාංක සීමාව ඇතුලත පවත්නා අවස්ථාවක එකී දෙවන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට බද්දට යටත් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව කොටපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| | *I වැනි තීරුව*<br>*බද්දට අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම්* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බදු මුදල රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන විට | 90 |
| 03. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 දක්වා නොඉක්මවන විට | 180 |
| 04. | රු 18,750 ඉක්මවන විට එහෙත් රු. 75,000 නොඉක්මවන විට | 360 |
| 05. | රු. 75,000 ඉක්මවන විට එහෙත් රු. 1,50,000 දක්වා නොඉක්මවන විට | 1,200 |
| 06. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 |

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:3 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරන ලදී.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 418/3

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### බලපත්‍ර ගාස්තු යෝජනාව 2019 වර්ෂය

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළදී නිකුත් කරන ලද බලපත්‍රයක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබිය ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් එක් එක් කර්මාන්තයක් වෙනුවෙන් එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරන්නා වූ හෝ පිළිගෙන ඇත්තාවූ ද වන අවස්ථාවක පහත දෙවන කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඒ හෝටලයේ හෝ අපානශාලාවේ හෝ නවාතැන්පලේ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පලෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක් (1%) විය යුතු බවට කොටපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

#### උපලේඛන අංක - 01

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු

| *වෙළෙඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම ර. 750 නොඉක්මවන විට රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත* |
|---|---|---|---|
| 01. බේකරියක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. තේ, කෝපි කඩයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. ලැගුම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. බාබර් සාප්පුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. මස් වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 07. මාළු වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

*අන්තරාදායක ව්‍යාපාර :*

| | | | |
|---|---|---|---|
| 1. බ්ලොක් ගල්/කොන්ක්‍රීට් වැඩපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. ගල්මෝල/ගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| වෙළෙඳාමේ ස්වභාවය | වාර්ෂික වටිනාකම ර. 750 නොඉක්මවන විට රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත |
|---|---|---|---|
| 3. කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. ගෑස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. ලී මෝලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර : | | | |
| 1. අවමංගලශ්‍ය ශාලාව | 500 0 | 750 0 | 1,000 0 |
| 2. රබර් එකතු කිරීමේ මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 3. කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළව අතුරු ව්‍යවස්ථාව යටතේ 2019 වන වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම.

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:4 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරන ලදී.

ඒ අනුව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේදී කොටපොල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලැබන බව වැඩිදුරටත් සඳහන් කරමි.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 418/4

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

කර්මාන්ත බදු යෝජනාව 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් එක් එක් කර්මාන්තයක් වෙනුවෙන් එහි දෙවන තීරුවේ අනුරූප තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා

අයකිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු එකී කර්මාන්ත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:5 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරන ලදී.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු

| *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|
| *වෙළෙඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම ර. 750 නොඉක්මවන විට රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත* |
| 01. ඇඳුම් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. පා පැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 04. යතුරු පැදි, ත්‍රීවිල් අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. පොල්තෙල් මෝලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. ගුවන් විදුලි හා රූපවාහිනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. ලියවන පට්ටලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. කුෂන් වැඩපලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. බීරළු, ලී කැටයම් වැඩ පලවල් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. කොප්පරා නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. රබර් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. වායු සමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

11 - 418/5

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය ප්‍රකාර පරිදි කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:6 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,<br>
සභාපති,<br>
කොටපොල ප්‍රාදේශීය සභාව,<br>
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,<br>
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 418/6

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (ආ) හා 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv (අ) තොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව 2008.11.30 වැනි දින අංක 1532 ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් කොටපොල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර, අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2019.01.01 වැනි දින සිට පනවා අය කරනු ලබන බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දන පවත්වන ලද මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:7 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,<br>
සභාපති,<br>
කොටපොල ප්‍රාදේශීය සභාව,<br>
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,<br>
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

ප්‍රචාරක දැන්වීම් විස්තරය

01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට (වර්ග අඩි 1ක මිළ රු. 30), බැනර්/කටවුට් සඳහා (වර්ග අඩි 1ක මිළ රු. 20)

02. මහා මාර්ගයට පෙනෙන පරිදි අවකාශී ඉඩකඩ භාවිතා කරමින් මහා මාර්ගයට යාබද ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා වර්ෂයකට
(වර්ග අඩි 1ක මිළ රු. 40), බැනර්/කටවුට් සඳහා (වර්ග අඩි 1ක මිළ රු. 20)

03. පළාත් පාලන අයාතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට
(වර්ග අඩි 1ක මිළ රු. 100), බැනර්/කටවුට් සඳහා (වර්ග අඩි 1ක මිළ රු. 40)

04. පළාත් පාලන ආයතන විසින් ඉදිකරන ලද විශාල දැන්වීම් පුවරු භාවිතා කරමින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා වර්ෂයකට
(වර්ග අඩි 1ක මිළ රු. 75), බැනර්/කටවුට් සඳහා (වර්ග අඩි 1ක මිළ රු. 30)

11 - 418/7

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

වෙනත් ගාස්තු 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් කොටපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2019 ජනවාරි 01 වැනි දින සිට පනවා අයකරනු ලබන බවට මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | රු. ශත |
|---|---|---|
| 01. | ඒ. ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) | 150 0 |
| 02. | ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තු | 500 0 |
| 03. | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු | |
| | * කොස් ගසක් සඳහා | 1,000 0 |
| | * වෙනත් ගසක් සඳහා | 250 0 |
| 04. | ගොඩනැගිලි අයදුම්පතක් මත අනුකුලතා සහතිකයක් සඳහා | |
| | * ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 1,000 0 |
| | * පදිංචි ස්ථානයකට | 500 0 |
| 05. | ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කරගැනීම සඳහා | |
| | * එක් වර්ෂයකට | 1,000 0 |
| 06. | වරිපනම් සහතික ගාස්තු | 150 0 |
| 07. | ජල සහතික ගාස්තු | 100 0 |
| 08. | වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 500 0 |
| 09. | අයාලේ යන ගවයින් සඳහා (එක් ගවයෙකුට දිනකට) | 500 0 |
| 10. | කැබලි සැලසුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු | 300 0 |

| | | රු. ශත |
|---|---|---|
| 11. | කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු එක් කැබැල්ලකට | 500 0 |
| 12. | ඉඩම් අනු කොටස්වලට බෙදීමේදී කැබලි සැලසසුම් අනුමත කිරීමේ ගාස්තු | |
| | ව.මී. 150 - 300 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 500 0 |
| | ව.මී. 301 - 600 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 400 0 |
| | ව.මී. 601 - 900 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 300 0 |
| | ව.මී. 900ට වැඩි (එක් කැබැල්ලක් සඳහා) | 200 0 |
| 13. | කාර්යාල ලේඛන උද්ධෘත පිටපත් නිකුත් කිරීම (එක් පිටපතක් සඳහා) | 150 0 |
| 14. | සභාව සතු භූමි ප්‍රවර්ධන කටයුතු සඳහා ලබා දීම (එක් දිනයක් සඳහා) | 1,000 0 |
| 15. | සභාව සතු වේදිකාව සහිත ප්‍රධාන ශ්‍රවණාගාරය කුළියට ලබාදීම (එක් දිනක් සඳහා) | 5,000 0 |
| 16. | ශ්‍රවණාගාරය සඳහා සභාවේ පුහුණු ශ්‍රමිකයෙකුගේ සේවය ලබාදීම (එක් දිනක් සඳහා) | 1,500 0 |
| 17. | කර්මාන්ත සඳහා අයකරන ලිපි ද්‍රව්‍ය හා සුහසාධන ගාස්තු | |
| | * ප්‍රජා පාදක සමිති මගින් සිදුකරන කර්මාන්ත සඳහා | 1,000 0 |
| | * කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකරන කර්මාන්ත සඳහා | 2,000 0 |
| 18. | ආදාහනාගාර සේවාව ලබා දීම සඳහා | |
| | * බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකුගේ මරණයක් ආදාහනය කිරීම සඳහා | 6,000 0 |
| | * බල ප්‍රදේශයෙන් පිටත ස්ථිර පදිංචිකරුවෙකුගේ මරණයක් ආදාහනය කිරීම සඳහා | 6,500 0 |

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:05:8 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

11 - 418/8

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### කසල ශෝධන ගාස්තු අයකිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 1X (ආ) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2007.11.30 වැනි දින සම්මත කරගත් 1988.08.23 වැනි දින 520/7 පොදු අතුරු ව්‍යවස්ථාවේ (04) අනුව කසළ ශෝධන සේවා මගින් සේවය සපයනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු/ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසල ශෝධන සේවා ගාස්තුවක් 2019 වර්ෂයේ ජනවාරි මස සිට මාස්පතා පනවා අයකිරීම සිදුකරනු ලබන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 01. | සර්විස් සෙන්ටර්/ගරාජ් | 500 0 |
| 02. | හෝටලයක්/ආපන ශාලාවක් සඳහා බාබර් සාප්පු | 300 0 |
| 03. | පළතුරු/එළවළු කඩයක් සඳහා | 400 0 |
| 04. | වෙනත් ව්‍යාපාර | 200 0 |
| 05. | ගෘහස්ථ | 100 0 |

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:9 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරන ලදී.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 418/9

## කොටපොල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අදාළ සංදර්ශන, ප්‍රසංග මගින් අලෙවි කරනු ලබන මුළු ප්‍රවේශපත්‍ර හා සංදර්ශන ටිකට්පත්වල මුළු වටිනාකමින් 7.5%ක විනෝද බදු මුදලක් කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 21 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05:5:10 යටතේ ඉහත යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද අබේවික්‍රම,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 418/10

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.